# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1868/66 - 2014 ජූනි මස 27 වැනි සිකුරාදා - 2014.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස: පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2014 අංක 01 දරන

ඌව පළාත් ''ආණ්ඩුකාරවර අරමුදල'' පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2014 ජූනි 05 වන දින සම්මත කරන ලදුව 2014 ජූනි 01 වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ,
ලේකම්,
ඌව පළාතේ පළාත් සභාව.

2014 ජූනි මස 17 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ඌව පළාත් සභාව**

***ඌව පළාතේ, පළාත් සභාවේ***
***2014 අංක 1 දරන***
***ඌව පළාත් "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තිය***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය මගින්, ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ සංශෝධිත ප්‍රඥප්තිය පරිච්ඡින්න කරනු ලබන අතර, ඌව පළාත් සභාවේ 2003 අංක 03 දරන ඌව පළාත් සභාවේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තියේ 3(2), 3(3) හා 3(4) උප වගන්ති වෙනුවට පහත සඳහන් උප වගන්ති මෙයින් ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ, පළාත් සභාවේ 2014 අංක 01 දරන ඌව පළාත් ''ආණ්ඩුකාරවර අරමුදල'' පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය)

ප්‍රධාන ප්‍රඥප්තියේ 3(2) වැනි උප වගන්තිය සංශෝධනය කිරීම.

02. 3.2 මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) ඌව පළාතේ ආණ්ඩුකාරවරයා.

(ආ) ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

(ඇ) ඌව පළාතේ පළාත් සභාවේ සභාපතිවරයා.

(ඈ) ඌව පළාතේ පළාත් සභාවේ ප්‍රතිපක්ෂයේ නායකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

(ඉ) ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා.

(ඊ) ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්වරයා.

(උ) ඌව පළාතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

(ඌ) ඌව පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.

(එ) ඊට අමතරව, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අභිමතය පරිදි ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ගණකාධිකාරිවරයෙකු, ඌව පළාතේ ස්ථිර පදිංචි නීතිඥ වෘත්තියේ නියුතු අයෙකු හා තවත් එක් සාමාජිකයෙක් ඇතුළු සාමාජිකයින් තිදෙනෙකු පත් කළ යුතුය. ආණ්ඩුකාරවරයා විසින් එක් එක් තැනැත්තන් වෙත නිකුත් කරනු ලබන පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තන් විසින් මෙම සංශෝධිත ප්‍රඥප්තියේ (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව ධූරය දැරිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3(3) වැනි උප වගන්තිය සංශෝධනය කිරීම.

03. 3.3 ආණ්ඩුකාරවරයා විසින් මෙම සංශෝධිත ප්‍රඥප්තියේ (2) වන උප වගන්තියේ (එ) ඡේදය යටතේ පත්කරනු ලැබූ යම් සාමාජිකයෙකුගේ පත්වීම් ආණ්ඩුකාරවරයා විසින් තම අභිමතය පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3(4) වැනි උප වගන්තිය සංශෝධනය කිරීම.

04. 3.4 මෙම සංශෝධිත ප්‍රඥප්තියේ (2) උපවගන්තියේ (එ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකුට තමා ඉල්ලා අස්වන බවට වූ ලිපියක් ආණ්ඩුකාරවරයා අමතා යැවීමෙන් ඕනෑම අවස්ථාවකදී මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකිය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

05. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවූවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය.

අර්ථ නිරූපනය.

06. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"පළාත් සභාව" යන්නෙන්, ඌව පළතේ පළාත් සභාව අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, ඌව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

07 - 361

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.